// Masthead
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 162/5A — 1981 ඔක්තෝබර් 14 වැනි බදාදා — 1981.10.14


සැ. යු.—1981. 10. 14 දින අංක 162/5 දරණ අති විශේෂ ගැසට් පත්‍රය අවලංගු කරන ලදී.

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතෙහි 30 (1) අ. වගන්තිය යටතේ පුවත්පත් කලාවේදීන්ට ආචාර ධර්ම සංග්‍රහයක් නියම කරමින් ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලය විසින් සාදනු ලැබ එම පනතේ 30 (3) වගන්තිය යටතේ පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලද රීති.

සරත් අමුණුගම,
ලේකම්,
රාජ්‍ය අමාත්‍යාංශය.

1981 ඔක්තෝබර් 08 දින.

1. මේ රීති, 1981 පුවත්පත් මණ්ඩල (පත්‍ර කලාවේදීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහය) රීති යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. සෑම පත්‍ර කලාවේදියකු විසින් ම—

(අ) පළකිරීම සඳහා තමා විසින් ලියන ලද කවර හෝ ලිපියක් පළ කිරීමට පෙර, එහි අඩංගු කරුණුවල සත්‍යතාව නිශ්චය කිරීම සඳහා තම බලය යටතේ ඇති සියලු සාධාරණ ක්‍රියා මාර්ග උපයෝගී කරගත යුතු ය;

(ආ) තමා අසත්‍ය හෝ සාවද්‍ය බව දන්නා නැතහොත් තමාට එසේ විශ්වාස කිරීමට හේතු ඇති යම් කාරණයක් වාර්තා කිරීමෙන් හෝ මුද්‍රණය කිරීමට නැතහොත් පළ කිරීමට සැලැස්වීමෙන් වැළකිය යුතු ය;

(ඇ) යම් ක්‍රියාවක් මගින් හෝ ඕනෑකමින්ම කරන ලද අත්හැරීමක් මගින් හෝ සත්‍යය විකෘති කිරීමෙන් වැළකිය යුතු ය;

(ඈ) යම් වාර්තාවක් හෝ ලිපියක් ලිවීම හෝ පළකිරීම සම්බන්ධයෙන් තමා වගකිව යුත්තේ ද එවැනි වාර්තාවක හෝ ලිපියක වූ යම් සාවද්‍යතාවක් නැතහොත් වැරදි තොරතුරක් නිවැරදි කිරීමට හැකි කෙටි කාලසීමාව තුළදී හැකි සියලු පියවර ගත යුතු ය; තව ද,

(ඉ) පොදු ජන රුචියට හෝ සදාචාරයට හානි කළ හැකි හෝ පොදු ජන රුචියේ හෝ සදාචාරයේ තත්ත්වය පහත හෙළීමට ඉඩ ඇති කිසිවක් පළ කිරීමෙන් හෝ පළ කිරීමට සැලැස්වීමෙන් වැළකිය යුතු ය.

3. සෑම පත්‍ර කලාවේදියකුම, තමා විසින් ලියනු ලබන හෝ මුද්‍රණය කිරීමට නැතහොත් පළකිරීමට සලස්වන යම් වාර්තාවක හෝ ලිපියක, එක් අතකින් යම් සිද්ධි ප්‍රකාශයක් සහ අනෙක් අතින් යම් මත දැක්වීමක් හෝ විවේචනයක් පැහැදිලි ලෙස වෙනස් කොට දැක්වීමට, තමාට ගත හැකි සියලු සාධාරණ ක්‍රියා මාර්ග ගත යුතු ය.

4. සෑම පත්‍ර කලාවේදියකුම, තමා වෙත යම් තොරතුරක් සපයන ලද යම් තැනැත්තකු විසින් ඒ තැනැත්තාගේ අනන්‍යතාව හෙළි කිරීමට බලය දෙන්නේ නම් මිස ඒ තොරතුර ලබාගත් කවර හෝ ප්‍රභවයන් පිළිබඳ රහස්‍යතාව රැකිය යුතු ය.

5. සෑම පත්‍ර කලාවේදියකුම, පුද්ගලයකුගේ කීර්ති නාමයට ගරු කළ යුතු අතර, මහජන කුතුහලයෙන් වෙන් කොට හඳුනාගත යුතු මහජන යහපත උදෙසා වන්නේ නම් මිස යම් පුද්ගලයකුගේ පෞද්ගලික ජීවිතය සම්බන්ධයෙන් වන යම් තොරතුරක් හෝ මත දැක්වීමක් වාර්තා කිරීමෙන් හෝ මුද්‍රණය කිරීමට නැතහොත් පළ කිරීමට සැලැස්වීමෙන් වැළකී සිටිය යුතු ය.

6. (1) අපරාධ හෝ අපරාධ නඩුවල විස්තර වාර්තා කිරීමේදී හෝ මුද්‍රණය කිරීමට නැතහොත් පළ කිරීමට සැලැස්වීමේදී—

(අ) ලිංගික අපරාධවලට භාජන වූවන් නම් කිරීම;

(ආ) සාපරාධ වරදක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ, තම දැනුම අනුව වයස අවුරුදු 18 ට අඩු වූ හා තම දැනුම අනුව කලින් වරදකරු කරනු නොලැබූ යම් තරුණ තැනැත්තකු නම් කිරීම; හෝ

(ඇ) අපරාධයක් සම්බන්ධයෙන් චෝදනා කරනු ලැබූ හෝ වරදකරු කරනු ලැබූ හෝ තැනැත්තකුත් ඒ තැනැත්තාගේ ඥාතියකුත් අතර ඇති සම්බන්ධතාව පාඨකයාට දැනුම් දීමේ පුදු කාර්යය සඳහා යම් තැනැත්තකු පළමු කී තැනැත්තාගේ ඥාතියකු ලෙස නම් කිරීම;

මහජන යහපත පිණිස වේ නම් විනා පත්‍ර කලාවේදියකු විසින් නොකළ යුතු ය.

(2) වෛවාහික කාරණා හෝ නඩු පිළිබඳ විස්තර වාර්තා කිරීමේදී හෝ මුද්‍රණය කිරීමට නැතහොත් පළකිරීමට සැලැස්වීමේදී පත්‍ර කලාවේදියකු විසින් සිත් වේදනා ඇති කරවන යම් විස්තර වාර්තා කිරීමෙන් හෝ පළකිරීමෙන් වැළකිය යුතු ය.

7. පත්‍ර කලාවේදියකු විසින් අන්‍යයකුගේ අදහස් හා ලිපි තමාගේ ඒවා ලෙස පළ නොකළ යුතු ය.

8. පත්‍ර කලාවේදියකු විසින් පරපීඩා, කාමුකත්වය, සැහැසිකම් හෝ සල්ලාලකම ප්‍රවර්ධනය කෙරෙන ආකාරයකට යම් කාරණයක් ඉදිරිපත් නොකළ යුතු ය.

9. අසභ්‍ය වූ යම් කාරණයක් පළකිරීම, මහජන යහපත පිණිස වන්නේ නම් මිස, පත්‍ර කලාවේදියකු විසින් එය වාර්තා කිරීම හෝ මුද්‍රණය කිරීමට නැතහොත් පළකිරීමට සැලැස්වීම නොකළ යුතු ය.

10. ජාති වාදී හෝ ආගමික භේද හෝ හිංසක ක්‍රියා ප්‍රවර්ධනය කිරීමේ කාර්යය සඳහා යම් කාරණයක් වාර්තා කිරීම හෝ මුද්‍රණය කිරීමට නැතහොත් පළකිරීමට සැලැස්වීම පත්‍ර කලාවේදියකු විසින් නොකළ යුතු ය.

11. සෑම පත්‍ර කලාවේදියකු විසින්ම තම වෘත්තියේ ගරුත්වය ආරක්ෂා කළ යුතු ය. තම වෘත්තියට සම්බන්ධ හෝ ආනුෂංගික යම් කාරණයක් සඳහා මුදලක්, දෙයක් හෝ සේවාවක් වශයෙන් වූ කවර හෝ අල්ලසක් ඔහු විසින් භාර නොගත යුතු ය.

10-499